පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව-සති පාසල

විෂය -නාට්‍ය හා රංග කලාව

තුන්වන වාරය-සැප්තැම්බර් මාසය-3සතිය

ශ්‍රේණිය -9

සැකසුම - චතුරිකා ප්‍රියදර්ශනී
ර/නිවි/කහවත්ත මධ්‍ය මහා

**සති පාසල - 15**

## දේශීය නාට්‍යකරුවන් හඳුනා ගනිමු.

### ගුණසේන ගලප්පත්ති (1927- )



- ***ජීවන තොරතුරු***

1927 ජුනි මස 07 වැනි දින මාතර දිකවැල්ලේ දී උපත ලද මොහු දික්වැල්ල මධ්‍ය විද්‍යාලයෙන් හා මාතර රාහුල විද්‍යාලයෙන් අධ්‍යාපනය හැදෑරූහ. පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ඇතුළත් ව ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධිය හැදෑරූහ. එදිරිවීර සරච්චන්ද්‍ර හා චාර්ල්ස් සිල්වා සමඟ නාට්‍යට සම්බන්ධ වී කටයුතු කළහ. ස්පාඤ්ඤ, ජපානය හා රුසියාව දී රටවල සංචාරය කරමින් විදේශීය නාට්‍ය පිළිබඳ ව මෙන් ම ස්ටැනිස්ලාවුස්කි රංග ක්‍රම පිළිබඳ ව මැනවින් අධ්‍යනයක යෙදුණහ. 1955 කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයේ ගුරුවරයෙකු ලෙස සේවය කළහ.

- ***<u>නාට්‍ය නිර්මාණ</u>***

ගුණසේන ගලප්පත්තිගේ ප්‍රථම නාටකය ලෙස සිංහල ගැමි රංග සම්ප්‍රදායන් ඇසුරින් 1957 නිෂ්පාදිත සඳකිඳුරු හැඳින්විය හැකිය. ගාර්ෂියා ලෝර්කාගේ යෙර්මා නාට්‍ය ඇසුරින් 1962 දී මූදුපුත්තු නාට්‍ය නිශ්පාදනය කරන ලදී.

- 1956 - සත්ත්ව කරුණාව (ආනන්ද ශාස්ත්‍රාලයේ සිසුන් සමඟ)
- 1957 - සඳකිඳුරු (පැරණි නාඩගම් ශෛලිය අනුව සකස් කර ඇත.)
- 1962 - වළහැඩියා (ඇන්ටන් චෙකෝව්ගේ වළහා නාට්‍යයේ අනුවර්තනයකි.)
- 1962 - මූදු පුත්තු (ධීවර ගම්මානයක ජීවත් වන ‘සරා’, ඇගේ සැමියා වන තේගිරිස් හා ඔහුගේ මලණුවන් වන ‘දියෝනිස්’ යන ත්‍රිත්වය යොදාගනිමින් සරා දරුවකු ලබා ගැනීමට දරන උත්සාහයත්, තේගිරිස් අතින් දරුවා මිය යාමත් පිළිබඳ ඛේදාන්තය විග්‍රහ කරන්නේ ගීතවත් බස් වහරක් මඟින් ප්‍රේක්ෂකයා ඇදබැඳ ගනිමිනි.
- 1963 - දේවතාඑළි (බර්බෝල්ට් බ්‍රේස්ට්ගේ ගුඩ් වුමන් ඔෆ් සෙට්සුවාන් හි අනුවර්තනයකි.)
- 1965 - මහා හේනේ රීරි යකා
- 1966 - ලියතඹරා (දේශපාලන තේමාවක් සහිත ව එළි දකියි)
- 1969 - තාත්තා (දේශීය සංස්කෘතියෙහි දක්නට ලැබෙන කුටුම්බයේ අන්යෝන්ය සහ සම්බන්ධය පිළිබිඹු කරයි.)
- 1976 - දෑස නිසා (ස්වතන්ත්‍ර)
- 1963 - කාලි යකින්නි (ගුවන්විදුලි නාට්‍යක් ලෙස)

## <u>පැවරුම</u>

1. ගුණසේන ගලප්පත්ති මහාතාගේ නාට්‍ය නිර්මාණ පහක් ලියා දක්වන්න.
2. ඔබ පන්ති කාමරයේ බිත්ති පුවත්පතට ගුණසේන ගලප්පත්ති මහාතා පිළිබඳව ලිපියක් ලියන්න.